# නාගසේන භික්ෂු සූත්‍රයෙහි හා පාලි මිලින්ද ප්‍රශ්නයෙහි ඇතුළත් මිලිඳු-නාගසේන දෙදෙනාගේ පූර්වාත්ම භව කථාව පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

*ජයසුන්දර, එම්. බී. බී.* [1]

'**නාගසේන භික්ෂු සූත්‍ර**' හෙවත් '**න-සියන්-පි-කියු-චිංග්**' (Na-sian-bii-chioujing) යනු පාලි සාහිත්‍යයෙහි සම්භාවනාවට පත් '**මිලින්දපඤ්හ**' නම් ධර්ම ග්‍රන්ථයේ චීන පරිවර්තනයයි. කර්තෘ අඥාත මේ කෘතිය ක්‍රි. ව. 317-420ත් අතර කාලයේ චීනයේ නැගෙනහිර චින් රාජවංශ යුගයේදී (Eatern Jin Dianasy) ලියැවුණු බව අනුමාන කෙරෙන අතර විද්‍යමාන පාලි කෘතිය ක්‍රි. පූ. 150ත් ක්‍රි. ව. 45ත් අතර කාලයේදී රචිත භාරතීය මූලාශ්‍රයක පසුකාලීන සංවර්ධනයකි. සරල සංක්ෂිප්ත ස්වරූපයෙන් රචනා කර ඇති නාගසේන භික්ෂු සූත්‍ර චීන පරිවර්තනය පරිච්ඡේද හෝ උපච්ඡේදවලට නොබෙදන ලද්දකි. නමුත් විද්‍යමාන පාලි කෘතිය පරිච්ඡේද හතකට බෙදා දැක්වේ. එහි මුල් පරිච්ඡේද තුන සමස්ත චීන පරිවර්තනයට බෙහෙවින් සමානය. එකී සමානතා පිළිබඳ කරන ලද අධ්‍යයනයන්ට අනුව පාලි හා චීන කෘති දෙකම අවිද්‍යමාන පොදු මූලාශ්‍රයකින් පැවත එන බවත්, එය විද්‍යමාන චීන පරිවර්තනයට සහ පාලි කෘතියේ මුල් පරිච්ඡේද තුනට බෙහෙවින් සමාන අන්තර්ගතයකින් යුත් කෘතියක් බවත් තහවුරු වී තිබේ. මෙහි එන මිලිඳු-නාගසේන දෙදෙනාගේ පූර්වාත්ම භවයන් පිළිබඳ කියැවෙන බාහිර කථාවෙහි ඇතුළත් සිදුවීම් කෘති දෙකෙහි විස්තර වන්නේ මඳ වෙනස්කම් සහිතවය. ඒ අනුව චීන කෘතියෙහි බාහිර කථාව හා සම්බන්ධ සිදුවීම් තුනක් පාලි පරිවර්තනයෙහි නොයෙදෙන අතර, සිදුවීම් හතක් කෘති දෙකෙහිම සමානව යෙදී තිබේ. මෙකී සමාන-අසමානතා පිළිබඳ සාවධාන වෙමින් මිලිඳු-නාගසේන දෙදෙනාගේ පූර්වාත්ම භවයන් පිළිබඳ කථාව පාලි හා චීන පරිවර්තනයන්හි අන්තර්ගතය හා කවරාකාර සම්බන්ධයක් දක්වන්නේද යන්න පිළිබඳ අධ්‍යයනයක නියැලීම මේ පර්යේෂණයේ අරමුණයි.

ප්‍රමුඛ පදඃ නාගසේන භික්ෂු සූත්‍රය, මිලින්දපඤ්හ, මිලිඳු-නාගසේන පූර්වාත්ම භව කථාව

[1]*සිංහල අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.* buddhisinh@gmail.com